# විසිවන සියවසේ ආරම්භයේ සිට
# අවසානය දක්වා
# ශ්‍රී ලංකාවේ විදුහල්පති භූමිකාවේ සිදුවූ
# වෙනස්කම් පිළිබඳ අධ්‍යයනයක්

UNIVERSITY OF COLOMBO, SRI LANKA
26 MAY 2005
LIBRARY

පී.ඩී. රංජිත් ප්‍රේමසිරි
විද්‍යා පුහුණු, ශාස්ත්‍රවේදී උපාධි,
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ඨ සම්මාන)

UCLIB
525871

අධ්‍යාපන දර්ශනපති උපාධියේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා
කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයට
ඉදිරිපත් කෙරෙන නිබන්ධය.
2004 අප්‍රේල්

# සංක්ෂිප්තය


මෙම අධ්‍යයනයෙහි ගැටලුව වූයේ වර්ෂ 1900 සිට වර්ෂ 2000 දක්වා ශ්‍රී ලංකාවේ විදුහල්පති භූමිකාවේ සිදු වූ වෙනස්කම් අධ්‍යයනය කිරීමයි.

මෙම අධ්‍යයනය ඓතිහාසික විමර්ශනයක් වූ බැවින් දත්ත රැස් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ඓතිහාසික මූලාශ්‍ර යොදා ගන්නා ලදි. එහි දී අධ්‍යාපන අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කරන ලද ලේඛන සහ පාසල්වල ලොග් සටහන් පොත් පරිශීලනය කෙරිණි. මෙයට අමතරව විශ්‍රාමික විදුහල්පතිවරුන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා දත්ත රැස් කිරීමට යොදා ගැනිණි.

පර්යේෂණ උපකරණයක් වශයෙන් සම්මුඛ සාකච්ඡා යොදා ගැනීමට නියැදිය තෝරා ගනු ලැබුවේ සංහේතුක නියැදිකරණ ක්‍රමය අනුවයි. මෙහි දී අතීත අත්දැකීම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා කලුතර දිස්ත්‍රික්කයේ හොරණ, මතුගම සහ කලුතර යන අධ්‍යාපන කලාපවල ජීවත්වන වඩාත් වෘද්ධතර විශ්‍රාමික විදුහල්පතිවරුන් තෝරා ගැනීමට උත්සාහ කරන ලදි.

මෙම අධ්‍යයනයේ දී විදුහල්පති භූමිකාවේ සිදු වූ කැපී පෙනෙන වෙනස්කම් සැලකිල්ලට ගෙන වර්ෂ 1900 සිට වර්ෂ 2000 දක්වා කාලය, කාල වකවානු තුනකට බෙදන ලදි. එනම් වර්ෂ 1900-1947, වර්ෂ 1948-1982 සහ වර්ෂ 1983-2000 වශයෙනි. එම කාල වකවානුවල දී විදුහල්පති භූමිකාවෙහි පැහැදිලි වෙනස්වීම් සිදු වූ බව අනාවරණය විය. මෙම වෙනස්වීම් සඳහා විවිධ සාධක බලපා ඇති බව ද අධ්‍යයනයෙන් අනාවරණය විය.

වර්ෂ 1900 සිට 1947 දක්වා විදුහල්පති භූමිකාවේ සිදු වූ වෙනස්කම් සහ ඊට බලපාන සාධක පිළිබඳ විමසීමේ දී වර්ෂ 1900 ට පෙර විදුහල්පති භූමිකාවේ ස්වරූපය ද සැලකිල්ලට ගන්නා ලදි. වර්ෂ 1900 වන විට විදුහල්පතිවරුන් රජයේ නියෝජිතයන් ලෙස කටයුතු කරමින් දැඩි අධිකාරී බලයකින් යුක්තව ස්වකීය භූමිකාව දැරූ බව පෙනේ. පටු හා සරල විෂයමාලාවක් අනුගමනය කරමින් අධ්‍යාපන සංවර්ධන භූමිකාවේ කාර්යයන්

ඉටු කළ අතර සිසුන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව පාසල් වත්ත වගා කිරීම සහ ආධුනික ගුරුවරුන් පුහුණු කිරීම වැනි කාර්යයන්ට ප්‍රමුඛතාව දී ඇත. එමෙන්ම දැඩි දඬුවම් මගින් විනය ආරක්ෂා කර ගැනීම තුළින් මෙකල විදුහල්පතිවරුන් මූලික වශයෙන් පාසල බලා ගැනීමේ භූමිකාව දැරූ බව පෙනේ.

වර්ෂ 1900 සිට 1947 දක්වා අවධියේ දී විදුහල්පති භූමිකාවෙහි කැපී පෙනෙන වෙනස්කම් රාශියක් ඇති වූ බව පෙනේ. මේ අවධියේ දී අධ්‍යාපන ආඥා පනත් ක්‍රියාත්මක වීම නිසා පාසලට ළමුන් ගෙන්වා ගැනීමේ කාර්යය හා නොපැමිණි ළමුන් පිළිබඳ වාර්තා කිරීම ද, විවිධ වසංගත රෝග පැතිර යන අවස්ථාවන්හි දී පාසල් සිසුන්ගේ ආරක්ෂකයා ලෙස කටයුතු කිරීම ද විදුහල්පති භූමිකාවට එක් විය. ප්‍රමාණවත් ගුරු මණ්ඩලයක් නොසිටි අවස්ථාවල දී ගුරු භූමිකාවෙහි කාර්යයන් ඉටු කිරීම ද ඔවුන් අතින් සිදු විය. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ නියෝජිතයා ලෙස කටයුතු කළ විදුහල්පතිවරයාට එවකට ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් වූ හෙයින් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ විශේෂ අවස්ථාවන් සැමරීම සඳහා උත්සව පැවැත්වීමට විදුහල්පතිවරයාට සිදු විය.

පාසල් දරුවාට දිවා ආහාරය සැපයීමේ කාර්යය මෙකල විදුහල්පති භූමිකාවට එක් වූ අතර ඒ සඳහා පාසල් ගෙවත්ත නිසි අයුරින් වගා කිරීමේ වගකීම ද විදුහල්පතිවරයාට පැවරිණි. ගුරු දෙගුරු සමිති පැවැත්වීම නිසා විදුහල්පතිවරයාගේ ප්‍රජා සම්බන්ධතා භූමිකාව පුළුල් වූ අතර චක්‍රලේඛවලින් සහ පාසල් පරීක්ෂකවරුන් මගින් ලැබී තිබුණු බලතල අනුව සාමාන්‍ය පරිපාලන කාර්යයන්හි දී පාසල තුළ ඒකාධිපති ස්වරූපයකින් කටයුතු කළ බව පෙනේ. සමස්තයක් ලෙස සලකන විට මෙම යුගයේ දී විදුහල්පති භූමිකාවට නව කාර්යයන් සමූහයක් එක්වීම නිසා එය තව දුරටත් සංකීර්ණ තත්වයකට පරිවර්තනය වූ බව පෙනේ.

වර්ෂ 1942 සිට වර්ෂ 1982 දක්වා යුගය විදුහල්පති භූමිකාවෙහි කැපී පෙනෙන වෙනස්කම් රාශියක් ඇති වූ යුගයක් ලෙස දැක්විය හැකිය. ජාතික නිදහස, ස්වභාෂා අධ්‍යාපනය ව්‍යාප්ත වීම, ආගමික නැඹුරුව සහ මානව අයිතිවාසිකම් පිළිබඳ ජනතාව දැනුවත් වීම වැනි සාධක නිසා විදුහල්පතිවරයාගේ නායකත්ව භූමිකාව ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපයකට නැඹුරු වනු දැකිය හැකිය. මෙකල විවිධ හේතූන් නිසා විදුහල්පතිවරයාගේ

ප්‍රජා සම්බන්ධතා භූමිකාව පුළුල් වූ අතර පරිපාලන සහ අධීක්ෂණ භූමිකාවන් වඩාත් සංවිධිත වූත්, විමධ්‍යගත වූත් තත්වයකට පත් විය. වාර සටහන්, දින සටහන්, සමුච්චිත ලේඛන, ශිෂ්‍ය ලකුණු පොත් සහ ශිෂ්‍ය වාර්තා පොත්, නිවාඩු ලේඛන, වැටුප් ලේඛන සහ පුද්ගලික තොරතුරු, ලිපිගොනු ආදිය භාවිතයට එක්වූ බැවින් විදුහල්පති භූමිකාව තොරතුරු පවත්වා ගැනීම සහ යාවත්කාලීන කිරීමේ කාර්යය ද එක් විය.

පාසල් හැර යන සිසුන් වෘත්තීය පුහුණුවකට නැඹුරු කිරීමේ කාර්යය ද විවිධ අවශ්‍යතාවන් සඳහා දේශපාලඥයින් සමග සබඳතා පැවැත්වීමේ කාර්යය ද මෙකල විදුහල්පති භූමිකාවට එක් විය. මෙම යුගයේ දි විවිධ අවස්ථාවල දි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වූ අතර එවැනි අවස්ථාවන්හි දි විෂයමාලා උපදේශකයෙකු සහ විෂයමාලාව ක්‍රියාත්මක කරන්නෙකුගේ කාර්යය ද විදුහල්පති භූමිකාවට එක් විය.

සමස්තයක් ලෙස සලකන විට මෙම යුගයේ දි විවිධ හේතු සාධක රාශියක බලපෑම නිසා විදුහල්පති භූමිකාවෙහි විවිධ වෙනස්කම් රාශියක් ඇති වූ බව පැහැදිලි වේ.

වර්ෂ 1983 සිට වර්ෂ 2000 දක්වා යුගයේ දි විදුහල්පති භූමිකාවෙහි කැපී පෙනෙන වෙනස්කම් රාශියක් ඇති විය. වර්ෂ 1983 දි පමණ පාසල සම්බන්ධ ව්‍යාපෘති සහ වෙනත් ක්‍රියාකාරකම් සඳහා පාසල් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම තුළින් සැලසුම්කරණ ක්‍රියාවලිය පාසල් පද්ධතියට හඳුන්වා දෙන ලදි. එමෙන්ම කළමනාකරණ පුහුණු වැඩසටහන් මගින් විදුහල්පතිවරුන්ට කළමනාකරණ පුහුණුව ලබා දුන් අතර වර්ෂ 1998 දි පාසල් පාදක කළමනාකරණය හඳුන්වා දෙන ලදි. ඒ අනුව මෙම අවධියේ දි සැලසුම්කරණය හා කළමනාකරණය විදුහල්පති භූමිකාවට එක් විය.

මෙම යුගයේ දි අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ප්‍රථම වරට විදුහල්පතිවරුන්, ඉගැන්වීමේ කාර්යයෙන් නිදහස් කළ අතර, පුළුල් අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලියක් හඳුන්වා දෙන ලදි. එමෙන්ම එකම භූගෝලීය පිහිටීමක් පිහිටි ආසන්න පාසල්, පර්ෂද හෝ පාසල් පවුල් ලෙස කාණ්ඩගත කළ අතර, එම පාසල් අධීක්ෂණය සඳහා ද ප්‍රධාන පාසලක විදුහල්පතිවරයෙකු පත් කරන ලදි. ගුරු උපදේශකවරුන් සහ විෂය අධ්‍යක්ෂවරුන් මගින් අධීක්ෂණ කාර්යය තව දුරටත් පුළුල් විය. මේ අනුව මෙම

අවධියේ දී විදුහල්පති භූමිකාවට අධීක්ෂණ කාර්යය වඩාත් සංවිධිත ලෙස එක්වූ බව පෙනේ.

වර්ෂ 1983 පමණ වන විට පාරිසරික ගැටලු පිළිබඳ රජය සහ ජනතාව තුළ දැඩි අවධානයක් ඇති විය. එබැවින් පාසල් පද්ධතිය මගින් පරිසර කමිටු, රුක් රෝපණ දින, පරිසර භට කණ්ඩායම් සහ පරිසර අලංකරණය ආදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සිදු විය. ඒ අනුව විදුහල්පතිවරයාට පරිසරවේදියෙකුගේ භූමිකාව දැරීමට සිදු විය.

ප්‍රබල ලෙස මත්ද්‍රව්‍ය විරෝධී වැඩසටහන් රට පුරා ක්‍රියාත්මක වූ මෙම යුගයේ දී පාසල් දරුවන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් වළක්වා ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් විදුහල්පතිවරයාට මත්ද්‍රව්‍ය නිවාරකයෙකුගේ භූමිකාව දැරීමට සිදු විය. පාසල් සංවර්ධන සමිති සහ ආදි ශිෂ්‍ය සංගම් ආදිය ප්‍රබල ලෙස සංවිධානගත වූ අතර එමගින් විදුහල්පතිවරයාගේ ප්‍රජා සබඳතා පැවැත්වීමේ භූමිකාව බෙහෙවින් ශක්තිමත් විය.

ශිෂ්‍ය ප්‍රජාවට අවශ්‍ය මූලික පහසුකම් සැපයීමට අමතරව රජය විසින් නොමිලේ ලබා දෙන පෙළපොත් හා නිල ඇඳුම් බෙදා දීමේ කාර්යය ද මෙම යුගයේ දී විදුහල්පති භූමිකාවට එක් විය. සිසුන් වෙනුවෙන් අතිරේක උපකාරක පන්ති, වැඩමුළු සහ කාර්ය සැසි සංවිධානය කරමින් අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලිය වඩාත් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට විදුහල්පතිවරු කටයුතු කළ අතර පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා පාසල් පාදක ඇගයීම ද ක්‍රියාත්මක කළහ. ඒ අනුව විදුහල්පති භූමිකාවට ඇගයුම්කරුවෙකුගේ කාර්යය ද එක් විය. පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා ගුණාත්මක යෙදවුම් නමැති මූල්‍යමය ප්‍රතිපාදනයක් පාසල් වෙත ලබා දුන් අතර එම මූල්‍යමය ප්‍රතිපාදන නිසි අයුරු කළමනාකරණය කිරීමේ වගකීම ද විදුහල්පති භූමිකාවට එක් විය.

මේ අනුව සමස්තයක් ලෙස සලකන විට වර්ෂ 1983 න් පසු අවධියේ දී විදුහල්පති භූමිකාවට සැලසුම්කරණය, කළමනාකරණය පුළුල් අභ්‍යන්තර හා බාහිර

අධීක්ෂණය, පාසල් පාදක ඇගයීම, පරිසර සංරක්ෂණය හා මත්ද්‍රව්‍ය නිවාරණය වැනි කාර්යයන් එක්වීම නිසා විදුහල්පති භූමිකාව අතිශයින් සංකීර්ණ වී ඇති බව පෙනේ.

වර්ෂ 1900 සිට වර්ෂ 2000 දක්වා විදුහල්පති භූමිකාවේ සිදු වූ වෙනස්කම් සහ ඊට තුඩු දුන් සාධක අධ්‍යයනය කිරීමෙන් අනතුරුව වර්තමානයෙහි විදුහල්පති භූමිකාවේ පවත්නා දුර්වලතා අවම කර ගැනීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කෙරේ. එහි කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය පිළිබඳ නව ක්‍රමෝපායයන් විදුහල්පතිවරුන්ට හඳුන්වාදීම සහ ඇගයුම් හා නිගමන කාර්යයන් යෝග්‍ය පරිදි වෙනස් කිරීම සඳහා විදුහල්පතිවරුන්ට බලය පැවරීම යන යෝජනා ඉදිරිපත් කෙරිණි.

විසිඑක්වෙනි සියවසට යෝග්‍ය වන අයුරින් විදුහල්පති භූමිකාව සකස් කිරීම සඳහා විදුහල්පතිවරයාට ස්වයං තීරණ ගැනීමේ අයිතිය ලබා දීම, විදුහල්පතිවරුන්ට නායකත්ව පුහුණුව ලබා දීම සහ රැකියා වෙළඳපොළ සමග සම්බන්ධීකාරකයෙකු ලෙස ක්‍රියා කිරීමට ඉඩ සැලසීම පිළිබඳ යෝජනා ද ඉදිරිපත් විය. එමෙන්ම මෙම අධ්‍යයනයේ දී විදුහල්පතිවරුන්ගේ වෘත්තිය හා අධ්‍යාපන සංවර්ධනයට අදාළ යෝජනාවක් සහ අනාගත පර්යේෂකයන් උදෙසා කෙරෙන යෝජනාවන් ද ඉදිරිපත් කෙරේ.

මෙම අධ්‍යයනයේ දී එළඹි නිගමන හා යෝජනාවන් විදුහල්පතිවරුන් ලෙස කටයුතු කිරීමට අපේක්ෂාවෙන් සිටින අයට ද විදුහල්පති පුහුණුව සඳහා වැඩසටහන් සම්පාදකයන්ට ද ප්‍රයෝජනවත් විය හැකිය.

සමස්තයක් ලෙස සලකන විට වර්ෂ 1900 සිට වර්ෂ 2000 දක්වා කාල සීමාව ඇතුළත විදුහල්පති භූමිකාව විවිධ හේතු සාධක නිසා විවිධ වෙනස්වීම්වලට ලක්වී ඇති බව පෙනේ. එමෙන්ම වර්තමානයේ දී ද විදුහල්පති භූමිකාව ස්ථාවර නොවන බවත් විවිධ හේතු සාධකවල බලපෑම නිසා නිරතුරුවම වෙනස්වීම්වලට භාජනය වෙමින් පවතින බවත් සඳහන් කළ හැකිය.

***********